සියලු ම හිමිකම් ඇවිරිණි.

SRI LANKA

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර III විභාගය - 2024 ජූලි

## (301) මූල්‍ය වාර්තාකරණය

(Financial Reporting)

2024-08-10
පෙරවරු
[08.45 – 12.00]

පිටු ගණන : 11
ප්‍රශ්න ගණන : 10

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):
    - (1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
      *උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*
    - (2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***
    - (3) *ඉල්ලුම් කරන ලද **මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,** ඔබ වෙත සපයන ලද **පොත්වල උත්තර** ලියන්න.*
    - (4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන තිබේනම් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*
    - (5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර **පමණක්** භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*
    - (6) *අර්ථකථන සහිත **කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව** අමුණා ඇත. සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*
    - (7) *ලකුණු 100.*

---

## A කොටස

(මුළු ලකුණු 20)

### 01 වන ප්‍රශ්නය

(a) මූල්‍ය වාර්තාකරණය සඳහා වූ සංකල්පනාත්මක ආකෘතිමය රාමුවට (Conceptual Framework) අනුව පහත සඳහන් සංකල්ප **පැහැදිලි කරන්න**:

(i) වාර්තාකරණ අස්තිත්වයක් (A Reporting Entity).

(ii) ආර්ථික සම්පතක් (An Economic Resource). (ලකුණු 03)

(b) පොදු අරමුණු සඳහා වන මූල්‍ය ප්‍රකාශනවල අරමුණ **පැහැදිලි කරන්න.** (ලකුණු 02)

(මුළු ලකුණු 05)

### 02 වන ප්‍රශ්නය

සංකලිත වාර්තාවක් (Integrated report) යනු, බාහිර පරිසරය තුළ ආයතනයක් විසින් තම උපායමාර්ග, පාලනය, කාර්යසාධකය හා අපේක්ෂා කෙටිකාලීන, මධ්‍ය කාලීන සහ දිගුකාලීන වශයෙන් වටිනාකම් නිර්මාණය කිරීමට දායකත්වය දක්වන්නේ කෙසේද යන්න පෙන්වන සංක්ෂිප්ත සන්නිවේදනයකි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) සංකලිත වාර්තාවක ඇතුළත් වන ප්‍රාග්ධන වර්ග තුනක්(03) **හඳුනා දක්වන්න.** (ලකුණු 03)

(b) සංකලිත වාර්තාකරණයේ අරමුණු දෙකක්(02) **සඳහන් කරන්න.** (ලකුණු 02)

(මුළු ලකුණු 05)

## 03 වන ප්‍රශ්නය

**සීමාසහිත ABC සමාගමේ** 2024 මාර්තු 31 දිනට, පහත සඳහන් තොරතුරු උපුටාගන්නා ලදී:

(1) දේපළ, පිරියත සහ උපකරණවල තොරතුරු පහත පරිදි වේ: *(රු.'000)*

| වත්කම් | පිරිවැය | 2024 මාර්තු 31 දිනට ධාරණ අගය (ගිණුම්කරණ ලියාහල අගය) | 2024 මාර්තු 31 දිනට බදු අරමුණු සඳහා වන සමුච්චිත ක්ෂය (ප්‍රාග්ධන දීමනාව) |
|---|---|---|---|
| ඉඩම | 8,000 | 8,000 | - |
| මෝටර් වාහන | 12,000 | 6,500 | 9,800 |

(2) 2023 අප්‍රේල් 01 දිනට, විලම්භිත බදු වගකීම රු.650,000/- කි.

(3) **සීමාසහිත ABC සමාගම,** වාර්ෂිකව 30% ක අනුපාතයක් යටතේ ආදායම් බදු ගෙවනු ලබන අතර, 2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බදු අයකළ හැකි ලාභය රු.2,600,000/- කි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත සඳහන් දෑ **ගණනය කරන්න:**

(a) 2024 මාර්තු 31 දිනට, විලම්භිත බදු වත්කම / වගකීම. (ලකුණු 03)

(b) 2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බදු වියදම. (ලකුණු 02)

(මුළු ලකුණු 05)

## 04 වන ප්‍රශ්නය

**සීමාසහිත සිග්මා සමාගම,** 2023 අප්‍රේල් 01 දින **සීමාසහිත බීටා සමාගමේ** කොටස් ප්‍රාග්ධනයෙන් 75% ක් රු. මිලියන 125 කට අත්පත් කරගන්නා ලදී. අත්පත් කරගත් දිනට **සීමාසහිත බීටා සමාගමේ** ශුද්ධ වත්කම්වල පොත් අගය පහත පරිදි විය:

| | **රු.'000** |
|---|---|
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 100,000 |
| පොදු සංචිතය | 24,000 |
| රඳවාගත් ඉපැයීම් | 12,000 |
| | **136,000** |

මෝටර් රථවල වෙළෙඳපොළ වටිනාකම ඉහළයාම හේතුකොටගෙන **සීමාසහිත බීටා සමාගමේ** අත්පත් කරගත් දිනට, ශුද්ධ වත්කම්වල සාධාරණ අගය එහි පොත් අගයට වඩා 10% කින් වැඩි වී ඇත. එදිනට පාලනය නොවන හිමිකමෙහි සාධාරණ අගය රු. මිලියන 40 කි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

අත්පත් කර ගැනීම මත ඇති වූ කීර්තිනාමය (goodwill) **ගණනය කරන්න.** (ලකුණු 05)

*A කොටසෙහි අවසානය*

## B කොටස

(මුළු ලකුණු 30)

### 05 වන ප්‍රශ්නය

(a) 2023 ජනවාරි 01 දින, **සීමාසහිත සත් සෝලා සමාගම,** විසින් මන්නාරමේ සූර්ය විදුලි බලාගාරයක් ඉදිකිරීමේ කටයුතු ආරම්භ කළ අතර, 2023 නොවැම්බර් 30 දින එහි ඉදිකිරීම් කටයුතු අවසන් කරන ලදී. බලාගාරයේ පිරිවැය මත ප්‍රාග්ධනීත කළ හැකි ණය පිරිවැය හඳුනාගැනීමට සමාගමේ කළමනාකාරීත්වය බලාපොරොත්තු වේ.

(1) ඉදිකිරීමේ මුළු පිරිවැය රු. මිලියන 400 ක් වූ අතර, සූර්ය බලාගාරය ඉදිකිරීම් කොන්ත්‍රාත්තුකරුට පහත සඳහන් පරිදි ගෙවීම් කරන ලදී:

| විස්තරය | ගෙවීම් කළ දිනය | රු.('000) |
|---|---|---|
| පළමු බිල්පත | 2023.02.01 | 50,000 |
| දෙවන බිල්පත | 2023.03.31 | 100,000 |
| තෙවන බිල්පත | 2023.09.01 | 140,000 |
| අවසාන බිල්පත | 2023.11.30 | 110,000 |
| | | **400,000** |

(2) **XYZ බැංකුවෙන්** ණය මුදල ලබාගෙන ඇති අතර, එය සූර්ය විදුලි බලාගාරය ඉදි කිරීම සඳහාම සම්පූර්ණයෙන් යොදවා ඇත. ඉදිකිරීම් සඳහා වැයවූ ඉතිරි මුදල, **ABC බැංකුවෙන්** ලබාගත් ණය මුදලින් යොදවා ඇත. මෙම මූල්‍ය පහසුකම් පිළිබඳව විස්තර පහත පරිදි වේ:

| බැංකුව | ණය මුදල (රු. '000) | වාර්ෂික පොලී අනුපාතය | ලබාගත් දිනය |
|---|---|---|---|
| ABC බැංකුව | 550,000 | 12% | 2023.04.30 |
| XYZ බැංකුව | 200,000 | 13% | 2023.01.01 |

(3) මෙම ණය මුදල් දෙකෙහිම ප්‍රාග්ධන ආපසු ගෙවීම 2024 ජනවාරි 01 දින ආරම්භ කරන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) 23 - ණය ගැණුම් පිරිවැය ප්‍රමිතයට අනුව, 2023 දෙසැම්බර් 31 දිනට සූර්ය විදුලි බලාගාරය මත ප්‍රාග්ධනීත කළ යුතු ණය ගැනුම් පිරිවැය **ගණනය කරන්න.** (ලකුණු 04)

(b) **සීමාසහිත ලංකා පොදු සමාගමේ** පහත සඳහන් සිදුවීම් වාර්තාකරණ කාලපරිච්ඡේදයෙන් පසුව සිදුවූ නමුත් 2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන අනුමත කිරීමට පෙර සිදුවිය:

(1) 2024 අප්‍රේල් 15 දින, සමාගම විසින් ප්‍රසිද්ධ නිවේදනයක් නිකුත් කරමින් එහි ප්‍රධාන මෙහෙයුම්වලින් එකක් නවතා දැමීමේ විධිමත් සැලැස්ම සන්නිවේදනය කළ අතර, එහි පිහිටි ගොඩනැගිල්ල සහ උපකරණ ඉවත් කිරීම සඳහා රු. මිලියන 50 ක් වැයවනු ඇත.

(2) සමාගම, සෑම වර්ෂයකම එහි පරිචයක් (practice) ලෙස, සේවකයින්ට රු. මිලියන 12 ක වාර්ෂික ප්‍රසාද දීමනාවක් ගෙවනු ලැබේ. ඒ අනුව, 2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයෙන් ජනිත වූ ලාභය මත සේවකයින් සඳහා රු. මිලියන 12 ක වාර්ෂික ප්‍රසාද දීමනාවක් ගෙවීමට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2024 අප්‍රේල් 20 දින අනුමත කරන ලදී.

(3) වර්ෂය අවසානයේ රු. මිලියන 10 ක්ව පැවති ආයෝජන, 2024 මැයි පළමු සතිය තුළ වූ වෙළෙඳපොළ කඩාවැටීම හේතුකොටගෙන රු. මිලියන 6 කට 2024 මැයි 10 දින, විකුණන ලදී.

(4) 2024 මැයි 15 දින, පැවති රැස්වීමේදී, සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එහි සාමාන්‍ය කොටස්හිමියන් සඳහා වර්ෂයේ ලාභයෙන් එක් කොටසක් සඳහා රු.5/- ක ලාභාංශයක් අනුමත කරන ලදී.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා 2024 මැයි 20 දින, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමැතිය ලබා දුන් බව උපකල්පනය කරන්න.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) 10 - වාර්තාකරණ කාලපරිච්ඡේදයෙන් පසු සිදුවීම් ප්‍රමිතයට අනුව, ඉහත සඳහන් එක් එක් සිදුවීම් 2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ **සීමාසහිත ලංකා පොදු සමාගමේ** මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනාගනු ලබන්නේ කෙසේදැයි **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(මුළු ලකුණු 10)

## 06 වන ප්‍රශ්නය

(a) 2021 අප්‍රේල් 01 දින රු.6,500,000/- කට මෝටර් රථයක් අත්පත් කරගත් අතර, එහි ප්‍රයෝජනවත් ආයු කාලය වසර 5 කි. මෝටර් රථ, පිරිවැය මත සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලබයි. 2024 මාර්තු 31 දින, සමාගම විසින් හානිකරණ පරීක්ෂාවක් (impairment test) සිදුකළ අතර, එහිදී මෝටර් රථයේ ඉවත්කිරීමේ වියදම් අඩුකළ පසු සාධාරණ වටිනාකම රු.2,300,000/- ක් සහ එහි භාවිතයට ගැනීමේ අගය (value in use) රු.2,400,000/- ක් බව අනාවරණය කරගන්නා ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) 36 - වත්කම් හානිකරණය අනුව, මෝටර් රථයේ හානිකරණ අලාභය **ගණනය කරන්න**. (ලකුණු 05)

(b) **සීමාසහිත Sard සමාගම,** වායු සමීකරණ අලෙවි කිරීම හා නඩත්තු සේවා සැපයීමේ නිරතව සිටී. 2023 අප්‍රේල් 01 දින සමාගම රු.15,000/- ක මාසික ගාස්තුවකට වායු සමීකරණ යන්ත්‍රයක් නඩත්තු සේවාවන් සහිතව සැපයීම සඳහා පාරිභෝගිකයෙකු සමඟ වසර 2 ක ගිවිසුමකට එළඹ ඇත.

මෙය වෙන වෙනම අලෙවි කරන්නේ නම්, වායු සමීකරණ යන්ත්‍රයේ වෙළෙඳපොළ මිල රු.240,000/- ක් වන අතර, නඩත්තු සේවාව සඳහා මාසික ගාස්තුව රු.6,000/- කි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (SLFRS) 15 - ගනුදෙනුකරුවන් සමඟ වන ගිවිසුම්වලින් වන ආයභාරය අනුව, 2024 මාර්තු 31 දිනෙන් සහ 2025 මාර්තු 31 දිනෙන් අවසන් වන වර්ෂ සඳහා ඉහත ගනුදෙනුවෙන් ඇතිවන ආයභාරය **හඳුනා දක්වන්න**. (ලකුණු 05)

(මුළු ලකුණු 10)

## 07 වන ප්‍රශ්නය

**සීමාසහිත Dots (පෞද්ගලික) සමාගමේ** 2024 මාර්තු 31 දිනට සහ 2023 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන පහත සඳහන් පරිදි වේ:

**සීමාසහිත Dots (පෞද්ගලික) සමාගම**

**මූල්‍ය තත්ත්ව ප්‍රකාශන** *(රු.'000)*

| මාර්තු 31 දිනට | 2024 | 2023 |
|---|---|---|
| **ජංගම නොවන වත්කම්:** | | |
| දේපළ, පිරියත සහ උපකරණ | 150,126 | 136,420 |
| සමුච්චිත ක්ෂය | (119,500) | (112,540) |
| **ධාරණ අගය** | **30,626** | **23,880** |
| **ජංගම වත්කම්:** | | |
| තොග | 125,786 | 118,970 |
| වෙළෙඳ සහ වෙනත් ලැබිය යුතු මුදල් | 39,041 | 116,870 |
| මුදල් සහ මුදල්වලට සමාන දෑ | 13,500 | 12,300 |
| | **178,327** | **248,140** |
| **මුළු වත්කම්** | **208,953** | **272,020** |
| **ස්කන්ධය සහ වගකීම්:** | | |
| **ස්කන්ධය:** | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය (සාමාන්‍ය කොටස් 13,800,000) | 138,000 | 138,000 |
| රඳවාගත් ඉපැයීම් | 7,262 | (12,800) |
| | **145,262** | **125,200** |
| **ජංගම නොවන වගකීම්:** | | |
| දිගුකාලීන ණය | 26,000 | 106,800 |
| සේවක ප්‍රතිලාභ (පාරිතෝෂික සඳහා වෙන්කිරීම) | 16,300 | 15,900 |
| | **42,300** | **122,700** |
| **ජංගම වගකීම්:** | | |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | 12,300 | 15,200 |
| කෙටිකාලීන ණය | 5,400 | 5,000 |
| ණය මත ගෙවිය යුතු පොලිය | 1,450 | 1,600 |
| ගෙවිය යුතු ආදායම් බදු | 2,241 | 2,320 |
| | **21,391** | **24,120** |
| **මුළු ස්කන්ධය සහ වගකීම්** | **208,953** | **272,020** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පොලී සහ බදු පෙර ලාභය රු.30,300,000/- ක් විය.

(2) 2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් බදු වියදම රු.290,000/- කි.

(3) සමාගම, 2024 ජනවාරි 31 දින අතුරු ලාභාංශයක් ගෙවන ලදී.

(4) 2023 සැප්තැම්බර් 30 දින, මෝටර් රථයක් රු. මිලියන 8.5 කට විකුණන ලදී. මෙම මෝටර් රථයේ පිරිවැය රු. මිලියන 5.2 ක් වූ අතර, 2023 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂය රු. මිලියන 4.2 කි. සමාගම, මෝටර් රථ පිරිවැය මත, සරල මාර්ග ක්‍රමයට වසර 5 ක් තුළ ක්ෂය කරනු ලබයි. එම රථයට ප්‍රතිස්ථාපනයක් (replacement) වශයෙන් 2023 ඔක්තෝම්බර් 01 දින නව මෝටර් රථයක් මිලට ගත් අතර, එය එදිනම ප්‍රාග්ධනීත කරන ලදී.

(5) වර්ෂය තුළදී, රු. මිලියන 5 ක කාරක ප්‍රාග්ධන සඳහා ණය මුදලක් ලබාගත් අතර, 2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ණයමුදල් මත පොලී වියදම රු.8,075,000/- කි.

(6) වර්ෂය තුළදී පාරිතෝෂික සඳහා කල වෙන් කිරීම රු.400,000/- ක් වූ අතර, වර්ෂය තුළදී කිසිදු පාරිතෝෂික ගෙවීමක් සිදුකර නොමැත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **සීමාසහිත Dots (පෞද්ගලික) සමාගමේ** මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, <u>වක්‍ර ක්‍රමය යටතේ</u> පිළියෙල කරන්න. (ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

(මුළු ලකුණු 50)

### 08 වන ප්‍රශ්නය

**සීමාසහිත ප්‍රින්ට්ත් සොලුෂන්ස් පොදු සමාගමේ** ගිණුම් පොත්වලින් 2024 මාර්තු 31 දිනට, පහත සඳහන් ශේෂ පිරික්සුම උපුටාගෙන ඇත:

**සීමාසහිත ප්‍රින්ට්ත් සොලුෂන්ස් පොදු සමාගම**

**2024 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම** *(රු.'000)*

| | හර | බැර |
|---|---|---|
| ප්‍රකාශිත ප්‍රාග්ධනය (සාමාන්‍ය කොටස් 10,000,000) | | 125,000 |
| 2023 අප්‍රේල් 01 දිනට රඳවාගත් ඉපැයීම් | | 30,000 |
| 2023 අප්‍රේල් 01 දිනට ප්‍රත්‍යාගණන සංචිතය | | 8,000 |
| **දේපළ, පිරියත සහ උපකරණ, පිරිවැයට / ප්‍රත්‍යාගණිත අගයට:** | | |
| ඉඩම - ප්‍රත්‍යාගණිත අගයට (පිරිවැය - රු. මිලියන 17) | 25,000 | |
| ගොඩනැගිල්ල | 27,000 | |
| යන්ත්‍ර | 22,000 | |
| **2023 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂය:** | | |
| ගොඩනැගිල්ල | | 15,000 |
| යන්ත්‍ර | | 8,800 |
| ඉවත් කිරීමේ ගිණුම | | 3,000 |
| ප්‍රාග්ධන නොනිමි | 38,400 | |
| කල්බදු ගෙවීම් | 3,344 | |
| 2024 මාර්තු 31 දිනට තොගය, පිරිවැයට | 63,000 | |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් / වෙළෙඳ ගෙවිය යුතු මුදල් | 56,000 | 41,000 |
| අතැති මුදල් සහ බැංකුවේ ඇති මුදල් | 22,356 | |
| 2023 අප්‍රේල් 01 දිනට වෙළෙඳ ලැබිය යුතු මුදල් සඳහා වන ප්‍රතිපාදනය | | 4,000 |
| විකුණුම් පිරිවැය / විකුණුම් | 124,000 | 255,000 |
| වෙනත් ආදායම් | | 8,300 |
| 2023 අප්‍රේල් 01 දිනට ගෙවිය යුතු ආදායම් බදු | | 4,300 |
| ගෙවූ ආදායම් බදු | 9,500 | |
| පරිපාලන වියදම් | 51,600 | |
| බෙදාහැරීමේ වියදම් | 35,100 | |
| මූල්‍ය වියදම් | 25,100 | |
| | **502,400** | **502,400** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2024 ජනවාරි 01 දින, සමාගම විසින් එක් මුද්‍රණ යන්ත්‍රයක් රු. මිලියන 5 කට විකුණන ලදී. මෙම යන්ත්‍රයේ පිරිවැය සහ විකුණු දිනයට මෙම යන්ත්‍රයේ ඇති සමුච්චිත ක්ෂය වෙන්කිරීම පිළිවෙලින් රු. මිලියන 6 ක් සහ රු. මිලියන 1.8 කි. ගැනුම්කරු විසින් එදිනම රු. මිලියන 3 ක් ගෙවූ අතර, එය ඉවත් කිරීමේ ගිණුමට බැර කරන ලද අතර, ඉතිරි මුදල 2024 අප්‍රේල් මාසයේදී ඔහු විසින් ගෙවන ලදී. ලැබුණු මුදල වාර්තා කිරීම හැරුණු විට, වෙනත් කිසිදු සටහනක් ගිණුම් පොත්වල තබා නොමැත.

(2) 2023 අප්‍රේල් 01 දින, සමාගම විසින් පිරිවැය රු. මිලියන 10 ක් වූ මුද්‍රණ යන්ත්‍රයක් 100% ක මූල්‍ය කල්බදු පහසුකම් යටතේ අත්පත් කරගන්නා ලදී. කල්බදු වාරික, සෑම වර්ෂයක් අවසානයේදීම ගෙවනු ලබන අතර, වාර්ෂික වාරිකය රු.3,344,000/- කි. කල්බදු කාල සීමාව වර්ෂ 05 ක් වන අතර, වාර්ෂික ව්‍යංග පොලී අනුපාතිකය 20% ක් වේ. කල්බදු කාලසීමාව අවසානයේදී යන්ත්‍රයේ හිමිකම සමාගම වෙත මාරු වේ. ගෙවන ලද කල්බදු වාරිකය, කල්බදු ගෙවීම් යටතේ වාර්තාකර ඇති අතර, මේ සම්බන්ධයෙන් ගිණුම් පොත්වල වෙනත් කිසිදු සටහනක් තබා නොමැත.

(3) සමාගමේ ප්‍රතිපත්තිය අනුව එහි ඉඩම් වර්ෂ 3 කට වරක් ප්‍රත්‍යාගණනය කරනු ලබයි. ඒ අනුව, 2024 මාර්තු 31 දින, ඉඩම රු.28,000,000/- කට නැවත අගය කරන ලද නමුත් මේ පිළිබඳව ගිණුම් පොත්වල කිසිදු සටහනක් තබා නොමැත.

(4) සමාගම විසින් එහි නව පරිපාලන ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු අවසන් කොට ඇති අතර, 2024 ජනවාරි 01 දින පටන් මෙහෙයුම් කටයුතු සඳහා එය භාවිතයට ගැනේ. මෙම ගොඩනැගිල්ල ඉදිකිරීමේ සම්පූර්ණ පිරිවැය, ප්‍රාග්ධන නොනිමි වැඩ ගිණුමේ සටහන්කොට ඇත.

(5) දේපල, පිරියත සහ උපකරණ, පිරිවැය මත, සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලබන අතර, එම වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය පහත සඳහන් පරිදි වේ:

| | | |
|---|---|---|
| ගොඩනැගිලි | : | වර්ෂ 50 |
| යන්ත්‍ර | : | වර්ෂ 05 |

(6) 2023 අප්‍රේල් 01 දිනට පවතින වෙළෙඳ ලැබිය යුතු මුදල් සඳහා වන ප්‍රතිපාදන වෙන්කිරීම තුළ **සහන පොත් සාප්පුවෙන්** ලැබිය යුතු රු.2,000,000/- ක විශේෂ ප්‍රතිපාදන වෙන්කිරීමක් ඇත. මේ වන විට මෙම මුදල අයකරගත නොහැකි බවට තහවුරු වී ඇති අතර, එය බොල් ණයක් වශයෙන් ලියා හැරිය යුතු වේ. තවද, 2024 මාර්තු 31 දිනට පැවති ඉතිරි වෙළෙඳ ලැබිය යුතු මුදල් ශේෂයෙන් 5% ක් වෙළෙඳ ලැබිය යුතු මුදල් සඳහා ප්‍රතිපාදනයක් ලෙස පවත්වාගෙන යාමට කළමනාකාරීත්වය තීරණය කර ඇත.

(7) 2023 අප්‍රේල් 01 දිනට, ගෙවිය යුතු ආදායම් බදු වගකීම රු.4,300,000/- ක් වූ අතර, 2023/24 තක්සේරු වර්ෂය සඳහා මුළු ආදායම් බදු වගකීම රු.5,600,000/- ක් ලෙස ඇස්තමේන්තුගතකොට ඇත. 2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය තුලදී කල සියලු ආදායම් බදු ගෙවීම්, "ගෙවූ ආදායම් බදු" ගිණුමට අයකර ඇත.

(8) සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා වන අනුමැතිය 2024 මැයි 31 දින ලබාදෙන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ප්‍රසිද්ධ කිරීමට සුදුසු ආකාරයෙන්, **සීමාසහිත ප්‍රින්ටින් සොලුෂන්ස් පොදු සමාගමේ** පහත සඳහන් දෑ, **පිළියෙල කරන්න**:

(a) 2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභා'ලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය (විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය). (ලකුණු 09)

(b) 2024 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය. (ලකුණු 08)

(c) 2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධයේ වෙනස්වීම් දැක්වෙන ප්‍රකාශනය. (ලකුණු 03)

(d) 2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දේපල, පිරියත සහ උපකරණවල වෙනස්වීම් දැක්වෙන සටහන. (ලකුණු 05)

(මුළු ලකුණු 25)

## 09 වන ප්‍රශ්නය

**සීමාසහිත සත් පොදු සමාගමේ** 2024 මාර්තු 31 දිනෙන් සහ 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂ සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනවල උද්ධෘතයන් සහ 2024 මාර්තු 31 දිනට සහ 2023 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනවල උද්ධෘතයන් පහත පරිදි වේ:

**සීමාසහිත සත් පොදු සමාගම**

**ආදායම් ප්‍රකාශනවල උද්ධෘත** *(රු.'000)*

| **මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂ සඳහා** | **2024** | **2023** |
|---|---|---|
| විකුණුම් | 210,000 | 99,500 |
| විකුණුම් පිරිවැය | (125,500) | (66,100) |
| දළ ලාභය | 84,500 | 33,400 |
| පොලී සහ බදු පෙර ලාභය | 71,600 | 19,500 |
| පොලී වියදම | (11,200) | (8,700) |
| බදු පෙර ලාභය | 60,400 | 10,800 |
| බදු පසු ලාභය | 42,150 | 8,100 |

**සීමාසහිත සත් පොදු සමාගම**

**මූල්‍ය තත්ත්ව ප්‍රකාශන** *(රු.'000)*

| **මාර්තු 31 දිනට** | **2024** | **2023** |
|---|---|---|
| **වත්කම්:** | | |
| **ජංගම නොවන වත්කම්:** | | |
| දේපළ, පිරියත සහ උපකරණ - ධාරණ අගයට | 155,000 | 140,000 |
| **ජංගම වත්කම්:** | | |
| තොග | 65,000 | 35,000 |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් | 35,000 | 26,000 |
| මුදල් සහ මුදල්වලට සමාන දෑ | 41,000 | 15,400 |
| | 141,000 | 76,400 |
| **මුළු වත්කම්** | **296,000** | **216,400** |
| **ස්කන්ධය:** | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 125,000 | 125,000 |
| රඳවාගත් ඉපැයීම් | 74,750 | 45,100 |
| | 199,750 | 170,100 |
| **දිගුකාලීන වගකීම්:** | | |
| දිගුකාලීන ණය | 29,000 | 21,000 |
| **ජංගම වගකීම්:** | | |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | 55,100 | 8,700 |
| ගෙවිය යුතු ආදායම් බදු | 5,500 | 4,600 |
| උපචිත වියදම් | 6,650 | 12,000 |
| | 67,250 | 25,300 |
| **මුළු ස්කන්ධය සහ වගකීම්** | **296,000** | **216,400** |

පහත සඳහන් අතිරේක තොරතුරු සලකා බලන්න:

(1) 2022 මාර්තු 31 දිනට, වෙළෙඳ ලැබිය යුතු මුදල් සහ තොගය පිළිවෙලින් රු.30,000,000/- ක් සහ 40,000,000/- ක් විය.

(2) සාමාන්‍ය කොටස් පිළිබඳ තොරතුරු පහත පරිදි වේ:

| **මාර්තු 31 දිනට** | **2024** | **2023** |
|---|---|---|
| නිකුත්කොට ඇති බර තැබූ සාමාන්‍ය කොටස් ගණන | 1,250,000 | 1,250,000 |
| කොටසක වෙළෙඳපොළ මිල | රු.32/- | රු.15/- |

(3) සියලුම විකුණුම් සහ ගැනුම්, ණය පදනම මත සිදුකරන බව උපකල්පනය කරන්න.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ඉහත සඳහන් තොරතුරු මත පදනම්ව, **සීමාසහිත සත් පොදු සමාගමේ** 2024 මාර්තු 31 සහ 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂ සඳහා / අවසන් දිනට පහත සඳහන් අනුපාත **ගණනය කරන්න**:

(i) දළ ලාභ අනුපාතය.

(ii) ශුද්ධ ලාභ අනුපාතය.

(iii) ක්ෂණික වත්කම් අනුපාතය.

(iv) ණයගැති එකතුකිරීමේ කාලය.

(v) තොග රඳවා ගැනීමේ කාලය.

(vi) කොටසක ඉපැයුම.

(ලකුණු 10)

(b) **සීමාසහිත සත් පොදු සමාගමේ** ඉහත ගණනය කරන ලද අනුපාතයන්, ඉහත වර්ෂ දෙක සමඟ සංසන්දනය කරමින්, විය හැකි විචලතාවයන් සඳහා වන හේතු ද සමඟින් සමාගමේ කළමනාකාරිත්වයට සාරාංශ වාර්තාවක් **පිළියෙල කරන්න.**

(ලකුණු 05)

(මුළු ලකුණු 15)

## 10 වන ප්‍රශ්නය

2023 අප්‍රේල් 01 දින, **සීමාසහිත රාමා සමාගම** විසින් **සීමාසහිත සීතා සමාගමේ** සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනයෙන් 80% ක් රු. මිලියන 100 කට අත්පත් කරගන්නා ලදී. අත්පත් කරගැනීම මත ඇතිවූ කීර්තිනාමය රු. මිලියන 18 ක් විය. **සීමාසහිත රාමා සමාගමේ** සහ **සීමාසහිත සීතා සමාගමේ** 2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂ සඳහා වන විස්තීර්ණ ආදායම් ප්‍රකාශන පහත සඳහන් පරිදි වේ:

**2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂ සඳහා**
**විස්තීර්ණ ආදායම් ප්‍රකාශන** *(රු.'000)*

| | **සීමාසහිත රාමා සමාගම** | **සීමාසහිත සීතා සමාගම** |
|---|---|---|
| විකුණුම් | 800,000 | 500,000 |
| විකුණුම් පිරිවැය | (465,000) | (225,000) |
| **දළ ලාභය** | **335,000** | **275,000** |
| **වෙනත් ආදායම්:** | | |
| කළමනාකරණ ගාස්තු සහ පොලී ආදායම් | 3,600 | 1,200 |
| දේපළ, පිරියත සහ උපකරණ විකිණීම මත ලාභය | 9,500 | 1,900 |
| **වියදම්:** | | |
| බෙදාහැරීමේ වියදම් | (64,000) | (134,000) |
| පරිපාලන වියදම් | (114,000) | (98,000) |
| මූල්‍ය වියදම් | (12,000) | (21,000) |
| **බදු පෙර ලාභය** | **158,100** | **25,100** |
| ආදායම් බදු | (41,000) | (5,100) |
| **වර්ෂය සඳහා ලාභය** | **117,100** | **20,000** |
| වෙනත් විස්තීර්ණ ආදායම් | (1,400) | 3,200 |
| **මුළු විස්තීර්ණ ආදායම්** | **115,700** | **23,200** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) වර්ෂය තුළදී, **සීමාසහිත රාමා සමාගම** විසින් රු. මිලියන 120 ක පිරිවැය වූ භාණ්ඩ, පිරිවැය මත 20% ක ලාභ ආන්තිකයක් සහිතව **සීමාසහිත සීතා සමාගමට** අලෙවිකොට ඇත. 2024 මාර්තු 31 දිනට, **සීමාසහිත රාමා සමාගමෙන්** මිලදී ගත් භාණ්ඩවලින් රු. මිලියන 45 ක් වටිනා භාණ්ඩ තොගයක් නොවිකිණී **සීමාසහිත සීතා සමාගමේ** ගබඩාව තුළ පැවතුණි.

(2) **සීමාසහිත රාමා සමාගම** විසින් කළමනාකරණ උපදේශක සේවාවන් සැපයීම වෙනුවෙන් රු.300,000/- ක මාසික කළමනාකරණ ගාස්තුවක් **සීමාසහිත සීතා සමාගමෙන්** අයකරගෙන ඇත.

(3) 2023 අප්‍රේල් 01 දින, **සීමාසහිත සීතා සමාගම** විසින් **සීමාසහිත රාමා සමාගමට** යන්ත්‍රයක් රු.8,000,000/- කට විකුණා ඇත. එදිනට එම යන්ත්‍රයේ ධාරණ අගය රු.7,200,000/- ක් විය. 2023 අප්‍රේල් 01 දිනට යන්ත්‍රයේ ඉතිරි ප්‍රයෝජනවත් ආයු කාලය වර්ෂ 5 ක් විය.

(4) **සීමාසහිත රාමා සමාගම** රු. මිලියන 25 ක කෙටිකාලීන ණය මුදලක් **සීමාසහිත සීතා සමාගමෙන්** ලබාගන්නා ලද අතර, වර්ෂය සඳහා වන ණය පොලිය රු. මිලියන 1.2 කි. **සීමාසහිත රාමා සමාගම විසින්** එය වර්ෂය තුළදී ගෙවා දමන ලදී.

(5) 2024 මාර්තු 31 දිනට, හානිකරණ පරීක්ෂාවක් (impairment test) සිදු කළ අතර, අත්පත් කරගැනීම මත ඇති වූ කීර්තිනාමය රු. මිලියන 2 කින් හානිකරණය වී ඇති බව හෙළිදරව් විය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය **පිළියෙල කරන්න.** (ලකුණු 10)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| දැනුම (1) | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | අදින්න | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | සම්බන්ධ කරන්න | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | සඳහන් කරන්න | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | හඳුනා දක්වන්න | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | ලැයිස්තුගත කරන්න | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| අවබෝධය (2) | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | හඳුනාගන්න | අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | අර්ථකතනය කරන්න | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | විස්තර කරන්න | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | පැහැදිලි කරන්න | අදාළ කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | නිර්වචනය කරන්න | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| භාවිතය (3) | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැලපීම. | සසඳන්න | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | ප්‍රස්තාර දක්වන්න | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | තක්සේරු කරන්න | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තිරණය කරන්න. |
| | | විසඳන්න | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | පිළියෙල කරන්න | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | ප්‍රදර්ශනය කරන්න | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | ගණනය කරන්න | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | භාවිත කරන්න | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| විශ්ලේෂණය (4) | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම. | සන්නිවේදනය කරන්න | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | සැකිල්ලක් සේ දක්වන්න | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | අසමානතා බලන්න | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | සමානකම් බලන්න | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | විමසන්න | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | වෙනස්කොට දක්වන්න | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දෑ හඳුනා ගැනීම. |
| | | විශ්ලේෂණය කරන්න | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |